# අපේ පාරම්පරික වී ප්‍රභේද



බුද්ධ භෝගය ලෙස හඳුන්වන වී ශාකයේ සිරිලක තුළ වගා ඉතිහාසය සලකන විට එහි වසර දෙදහස් තුන්සීයයකටත් වැඩි ලිඛිත ඉතිහාසයක් දක්නට ඇත. පඬුවස් දෙව් රජ සමයේ රචිත මහාවංශයෙහි ප්‍රථම වරට වී වගාව පිළිබඳව ලිඛිත සාක්ෂි ඇත. එලෙසම 13 වන සියවසේ රචිත පූජාවලිය කෘතියෙහිද පාරම්පරික වී වර්ග කිහිපයක නම් සඳහන් ව ඇත. වසර දහස් ගණනක් පුරා ගොවි මහතුන් විසින් වගාකරමින් පවත්වාගෙන එනු ලබන වී වර්ග පාරම්පරික වී හෙවත් භූමි දර්ශ (Land races) ලෙස සැලකේ. දැනට ශ්‍රී ලංකාවේ පාරම්පරික වී වර්ග 600 කට අධික සංඛ්‍යාවක් පවතින අතර ඒවායින් වර්ග 10 කට ආසන්න සංඛ්‍යාවක් මෙරට පුරා බහුලව ව්‍යාප්තව පවතී. ඒවායින් සුදුරු සම්බා, සුවඳැල්, සුදු හීනටි, කලු හීනටි, පච්චපෙරුමාල්, රත්තැල්, මුරුන්ගකායන් යන වී වර්ග ගොවීන් අතර වඩාත් ජනප්‍රිය වී ඇත.

පාරම්පරික වී වර්ග නම් කිරීමේදී ප්‍රධාන ලෙස බීජ වල හැඩය, පැහැය, සුවඳ, වී වර්ගය හඳුනාගත් ප්‍රදේශය, වී වර්ගය හඳුනාගත් පුද්ගලයාගේ නම භාවිතා කර ඇත. ඒ එකිනෙකට උදාහරණ ලෙස පිළිවෙලින් කුරුළුතුඩ, කලු හීනටි, සුදුරු සම්බා, බටපොල ඇල්, හේරත් බණ්ඩා ආදී වී වර්ග දැක්විය හැකිය. පාරම්පරික වී පිළිබඳ මෑත කාලීන ඉතිහාසය සැලකීමේදී ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් විසින් රචිත "එදා හෙළදිව" කෘතියෙහි මා වී, හාතියාල්, හොඬරවාලු, ඇල්පත්කල්, හීනටි යන වී වර්ග පිළිබඳ තොරතුරු සඳහන් වේ. තවද කෘෂිකර්ම උපදේශකවරයෙක් වූ ඩබ්. මොලගොඩ

මහතා විසින් වී වර්ග 567 ක නම් සඳහන් ලිපියක් ''ශ්‍රී ලංකාවේ වී වර්ග'' නමින් ට්‍රොපිකල් ඇග්‍රිකල්චරිස්ට් සඟරාවේ 1924 අප්‍රේල් කලාපයේ පළකර ඇත.

2012 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව හෙක්ටයාර 3617 ක පාරම්පරික වී වගාව ව්‍යාප්තව පවතින බව දැක්වේ. අතීතයේදී පාරම්පරික වී වගාව බහුලවම ස්වපාරිභෝජනය සඳහා කෙරුනත් වර්තමානය වන විට එම වී වර්ග කෙරෙහි වෙළඳපොල ඉල්ලුම වැඩි වීමත් සමඟ එය වාණිජ මට්ටමේ වගාවක් ලෙස ගොවි මහතුන් අතර ප්‍රචලිත වෙමින් පවතී. මෙම පැරණි වී වර්ග වල නිෂ්පාදනය අඩු වීමත් නිසා වෙළඳපළ සැපයුම අඩු වීම හේතුවෙන් ඒවාට වැඩි මිලක් ලැබීම පැරණි වී වර්ග ප්‍රචලිත වීම සඳහා එක් හේතුවක් විය හැකිය. සාමාන්‍යයෙන් පාරම්පරික වී වගාවෙන් නව වී ප්‍රභේද වල මෙන් ඉහල අස්වනු විභවයක් අපේක්ෂා කළ නොහැකි අතර අක්කරයට බුසල් 40 - 60 පමණ ප්‍රමාණයක් ලබා ගත හැකි අවස්ථා වාර්තා වී ඇත. පාරම්පරික වී වර්ගවල වැදගත් ගුණාංග ලෙස නොයෙකුත් රෝග හා පළිබෝධ හානි වලට ඔරොත්තු දීමේ හැකියාවද, අහිතකර පරිසර තත්ත්ව වලට ඔරොත්තු දීමේ හැකියාවද, ඖෂධීය වටිනාකමද, ධාන්‍ය ගුණාත්මයෙන් ඉහළ වීමද දැක්විය හැකිය. තවද මෙවැනි විශේෂ ලක්‍ෂණ සහිත පැරණි ප්‍රභේද නව වී ප්‍රභේද අභිජනනයේදී මව් පිය ආර ලෙස භාවිත කළ හැකි වීමද වාසි සහගත වේ. දහනල, පොක්කාලි, ආදි වී ප්‍රභේද වල පවතින හිතකර ලක්‍ෂණ එලෙස භාවිතයට ගෙන ඇත. එලෙසම මෙම ජාන සම්පත් තවදුරටත් උපයෝජනය වැඩි කිරීම පර්යේෂණ අංශයේ වගකීමක් වන්නේය. පාරම්පරික වී වර්ග කිහිපයක පවතින විශේෂිත ලක්‍ෂණ පහත දක්වා ඇත.

**වී වර්ග සමහරක විශේෂිත ලක්‍ෂණ**

| විශේෂිත ලක්‍ෂණ | වී වර්ගය |
|---|---|
| පැළ මැක්කාට ප්‍රතිරෝධී | දහනල |
| ලවණතාවයට ඔරොත්තු දීම | පොක්කාලි |
| ගංවතුරට ඔරොත්තු දීම | දෙවරැද්දරි, මා වී, ගොඩ වී |
| යකඩ විෂවීමට ඔරොත්තු දීම | කහට වී |
| නියඟයට ඔරොත්තු දීම | නියන් වී, ගොඩ හීනටි |
| කෙටි කාලීන ප්‍රභේද | හැටදා වී |
| ධාන්‍ය ගුණාත්මයෙන් ඉහළ වීම | සූදුරු සම්බා, සුවඳැල්, රත් ඇල් |
| ඖෂධීය වටිනාකම | කලු හීනටි සුවඳැල්, මා වී |

වර්තමානය වනවිට සමහර පාරම්පරික වී වර්ගවල සහල් පුද්ගලික ආයතන මගින් විදේශ වෙළෙඳපල වෙත නිකුත් කිරීමටද පෙළඹී ඇත. මෙම පාරිභෝගික රුචිකත්වය ඉහළ යාමට හේතු වී ඇත්තේ පාරම්පරික වී වර්ගවල පවතින ඖෂධීය වටිනාකමක් සහ ඉහළ ගුණාත්මයක් විදහා දැක්වීම විය හැකිය. කෙසේ වුවද මෙම ඖෂධීය ගුණාංග පිළිබඳ රෝගීන් යොදාගෙන වෛද්‍ය විද්‍යාත්මකව මෙතෙක් සනාථ කර

නොමැත. නමුත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේදී පාරම්පරික වී වර්ග බොහෝ ප්‍රමාණයක් ඖෂධ ලෙස භාවිතා කරනු ලැබේ. කලුහීනටි යනු එලෙස ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේදී බහුලව භාවිතා වන වී වර්ගයකි. පාරම්පරික වෙදකමට අනුව ශරීරගත විෂ නැසීමේ ගුණය, කාය ශක්තිය වර්ධනය කිරීම, මල බද්ධය දුරු කිරීම, දියවැඩියාව පාලනය, කුඩා දරුවන්ගේ ශරීර වර්ධනය කිරීමේ හැකියාව කලු හීනටි සහල් වල පවතින බව සැලකේ. තවද සුවඳැල් සහල් වාජීකරණ ගුණයෙන් යුතු බවත්, ශරීර වර්ධනයට උපකාරී වන බවත් සැලකේ.

**පාරම්පරික වී වර්ග කිහිපයක විස්තර හා ඖෂධීය ගුණාංග**

| වී වර්ගය | ස්වභාවය හා ඖෂධීය ගුණාංග |
|---|---|
| සුවඳැල් | සුදු පැහැති සහලකි, මිහිරි සුවඳක් හා රසයක් ඇත, සමබර ශරීර වර්ධනයට උපකාරී වේ, වාජීකරණ ගුණ සහිතය, කටහඬ මිහිරිවීමට උපකාරී වේ |
| පච්චපෙරුමාල් | රතු පැහැති සහලකි, දියවැඩියාව සුවකරයි, අධික රුධිර පීඩනය පාලනය කරයි. වකුගඩු හා පිළිකා රෝගවලින් පෙළෙන රෝගීන්ට ගුණදායකයි |
| සුදුහීනටි | සුදු පැහැති සහලකි, පෝෂණීය හා ශක්තිජනක වේ, දියවැඩියාව පාලනය කරයි |
| කලුහීනටි | රතු පැහැති සහලකි, ශරීරගත විෂ නැසීමේ හැකියාව ඇත, දියවැඩියාව පාලනය කරයි, සෙංගමාලය හා සර්පවිෂ ශරීරගතවුවන්ට කැඳ සාදා දීමට සුදුසුය, ලිංගික ශක්තිය වර්ධනය කිරීමේ හැකියාව ඇත |
| රත්තැල් | රතු පැහැති සහලකි, උණ සැදුන රෝගීන්ට කැඳ සාදා දීමට සුදුසුය, මුත්‍රා පිටකිරීම පහසු කරය, ශරීරය සිසිල් කරන ගුණයෙන් යුතුය |
| කුරුතුඩ | රතු පැහැති සහලකි, මුත්‍රා පිටකිරීම පහසු කරයි, වාජීකරණ ගුණයෙන් යුතු අතර ශරීර ශක්තිය වැඩිකරයි |
| මඩතවාළු | රතු පැහැති සහලකි. දියවැඩියාව පාලනය කරයි. යකඩ හා සින්ක් ප්‍රමාණය වැඩිය |
| මා වී | රතු පැහැති සහලකි. ශරීරය සිසිල් කරන ගුණයෙන් යුතුය. දියවැඩියාව පාලනයට උපකාරී වේ. ක්ෂයරෝගය සැදුන රෝගීන්ට ගුණදායකය |

පාරම්පරික වී වර්ගවල සහල් බොහෝමයක් රතු පැහැති වන අතර තද නිවුඩු සහිතය. බත පිසූ පසුව තරමක් රළු ස්වභාවයක් ඇත. එබැවින් දෛනිකව ආහාරයට ගැනීම අපහසුවේ. බොහෝ විට මෙම වී වර්ගවල සහල් ආයුර්වේද වෙදකමේදී රෝගීන්ට කැඳ ලෙස සකස් කර දීමට භාවිතා වේ. පහත දක්වා ඇත්තේ දැනට ශ්‍රී ලංකාවේ වැඩිපුර වගා කරනු ලබන වී වර්ග කිහිපයකි.



සුවඳැල්



සුදු හීනටි



කලු හීනටි



පච්චපෙරුමාල්



රත්තැල්



සුලායි

පාරම්පරික වී වර්ග වල පීදීම මාස 3 සිට මාස 5 - 6 දක්වා කාල පරාසයක විහිදී පවතී. ඒ එකිනෙකට උදාහරණ පහත වගුවහි දක්වා ඇත.

පාරම්පරික වී වර්ග සමහරක වයස් කාණ්ඩ

| වයස් කාණ්ඩය | වී ප්‍රභේද වලට උදාහරණ |
|---|---|
| මාස 5 - 6 | මා වී, ගෝනබරු, ඇල් වී, හාතිඇල්, මුතුමානික්කම්, පුල්ලි වී, මඩඇල්, රත්ඇල්, වෙල්ලෙයිඉලංකායන්, පෙරියවෙල්ලෙයි |
| මාස 4 - 4 1/2 | කුරුළුතුඩ, අකුරම්බොඩ, බාල මා වී, දෙවරැද්දිරි, හොඩරවාල, කහරමනා, මුරුන්ගකායන්, සුවඳසම්බා, හීන්සුලායි කිරිනාරන් |
| මාස 3 - 3 1/2 | සුදුහීනටි, කලුහීනටි, සුදුරුසම්බා, සුවඳැල්, පච්චපෙරුමාල්, හීනටි, හේරත් බණ්ඩා, දහනල, බටපොලඇල්, කහටවී, කොට්ටියාරන් |

බොහෝ විට මාස 5 - 6 වයස් කාණ්ඩයේ ප්‍රභේද ප්‍රභා අවධි සංවේදීතාවය දක්වන අතර එබැවින් මහ කන්නයේ පමණක් වගා කෙරේ. තවද එබඳු වී ප්‍රභේද වල වගාව සිදු කිරීමේදි සැප්තැම්බර් මාසයේ මුල් කාලයේදී වගාව ආරම්භ කර දෙසැම්බර් - ජනවාරි මාස වලදී මල් පිපීම සමපාත වන පරිදි වගාව පිහිටුවා ගැනීම සුදුසුය. එවිට ජනවාරි හෝ පෙබරවාරි වන විට අස්වනු නෙලාගත හැකි වනු ඇත. එබැවින් පාරම්පරික වී වගාව පිළිබඳ උනන්දුවක් දක්වන කෙනෙකු ඉහතින් සඳහන් කළ කරුණු කෙරෙහි වැඩිපුර අවධානයක් හා අවබෝධයක් සහිතව කටයුතු කළ යුතුය.

පාරම්පරික වී වර්ග වලින් බොහෝ ප්‍රමාණයක් සාමාන්‍යයෙන් මීටර් 1 - 1.5 දක්වා උසින් යුතුය. මේවායේ කඳ ශක්තිමත් නොවීම හා කඳ සිහින් වීම හේතුවෙන් පහසුවෙන් ඇද වැටීමට ලක් වේ. කොළදාව වැඩි අතර බොහෝවිට සිහින් දිගටි පත්‍ර සහිතය. නව වී ප්‍රභේද වලට සාපේක්ෂව පඳුරු ගහණය අඩුය. පීදුන පසුවත් බොහෝ ප්‍රභේද ඇද වැටීමට ලක් වේ. මෙය අස්වැන්න නෙලීමට බාධාවකි. තවද ඉක්මනින් ඇට හැලීම සිදු වේ. එබැවින් සුදුසු අවස්ථාවේදීම අස්වනු නෙලා ගැනීම අවශ්‍ය වේ. රසායනික පොහොර යෙදූ විට ගසේ කොළදාව වැඩි වීමත්, උසින් වැඩි වීමත් සිදුවන අතර ගසෙහි ශක්තිමත් භාවය අඩු වීමද සිදු වේ. තවද රසායනික පොහොර, විශේෂයෙන් නයිට්‍රජන් (N) යෙදූ විට කෘමි හානි හා පළිබෝධ හානි වලට පාත්‍ර වීම ද වැඩිපුර සිදු වේ. රසායනික පොහොර යෙදූ පමණින් වගාවෙන් ඉහළ අස්වනු විභවයක් අපේක්ෂා කළ නොහැකි අතර එබැවින් රසායනික පොහොර අඩුවෙන් භාවිතා කිරීම වඩාත් සුදුසුය. ශ්‍රී ලංකාවේ දැනට පාරම්පරික වී වර්ග කාබනික වී වගා ක්‍රමයත්

සමඟ බොහෝ විට භාවිතා කෙරේ. සාමාන්‍යයෙන් පාරම්පරික වී වගාවෙන්, නව වැඩි දියුණු කරන ලද වී ප්‍රභේදවල මෙන් ඉහළ අස්වනු විභවයක් අපේක්ෂා කළ නොහැක. මෙම අස්වනු ප්‍රමාණයද වගා කරන වී ප්‍රභේදය හා වගාවේ නිසි කළමනාකරණය මත වෙනස් වේ. ගුණාත්මක බිත්තර වී භාවිතයත් සුදුසු කාලයේ වල් පැළෑටි පාලනයත්, වගාව කෘමි හා පළිබෝධ හානිවලින් තොරව පවත්වා ගැනීමත්, සුදුසු පරිදි කාබනික හා අකාබනික පොහොර භාවිතයත් සිදු කරන්නේ නම් ඉහළ අස්වැන්නක් ලබා ගැනීම දුෂ්කර නොවනු ඇත.

වර්තමානය වන විට පාරම්පරික වී වගාව කෙරෙහි ගොවීන්ගේ වැඩි නැඹුරුවක් ඇති වෙමින් පවතී. එයට හේතුව රජය මඟින්ද පාරම්පරික වී වගාව ව්‍යාප්ත කිරීමට නොයෙකුත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. නමුත් මෙම පාරම්පරික වී වර්ග දැනට ඉහළ අස්වනු විභවයක් සහිත කුඹුරු ඉඩම් සඳහා භාවිතා කිරීම යෝග්‍ය නොවන අතර සුදුසු ප්‍රදේශ හඳුනාගෙන වගාව ව්‍යාප්ත කිරීමත් ඒ සඳහා පුරන් කුඹුරු හා ආන්තික කුඹුරු යොදා ගැනීමත් සුදුසුය. එසේ නොවුනහොත් ශ්‍රී ලංකාව ලඟා වී ඇති සහලින් ස්වයංපෝෂිත තත්වයෙන් අපගමනය වීමක් සිදු වනු ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් දීර්ඝ කාලයක සිට සිදුකල පාරම්පරික වී වර්ග එකතු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් ලෙස දැනට වී වර්ග විශාල ප්‍රමාණයක් ගන්නොරුව පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ දිගුකාලීන සංරක්ෂණ ඒකකයේ සහ බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ කෙටිකාලීන සංරක්ෂණ ඒකකයේ සංරක්ෂණය කර ඇත. තවද එම වී වර්ගවල කුඩා ප්‍රමාණයේ නියැදි අවශ්‍යතාවය අනුව පර්යේෂණ ආයතනවලට, විශ්ව විද්‍යාලවලට, පාසැල් ළමුන්ට, ගොවිමහතුන්ට, පුද්ගලික ආයතනවලට ලබාදීමට කටයුතු කෙරේ. එමඟින් ඒවා පර්යේෂණ කටයුතු සඳහා වැඩිපුර භාවිතා කිරීමත්, තවදුරටත් ව්‍යාප්ත වීම මගින් සංරක්ෂණය පහසුවීමත් අපේක්ෂිතය. එලෙසම වසර දහස් ගණනක් පුරා සුරැකිව ආ පාරම්පරික වී වර්ගයන්ගේ ජාන සම්පත් අනාගත පරපුර වෙත සුරැකිව දායාද කිරීම අප කාගේත් ජාතික වගකීමක් වන්නේය.

කේ. ඒ. කේ. විජේසේන
පර්යේෂණ නිලධාරිනි
වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය,
බතලගොඩ, ඉබ්බාගමුව



